# දේශපාලන කාටුන් නිර්මාණයේදී කාටුන් ශිල්පීන්ට සිදු  ඇති ගැටලු සහ බලපෑම්

මධුරානි අත්තනායක[1] දිලිනි ලක්ෂිකා[2]

ස්වභාවික ලෝකයේ පවතින දෑ හාස්‍ය රසය ජනනය කරන අයුරින්  විසුළු ස්වරූපයකින් යුක්තව අඳිනු ලබන සිතුවම කාටුන් ලෙස සරලව අර්ථ දැක්විය හැකිය. දේශපාලන කාටුන් කලාවේ ආරම්භය සිදු වූයේ ඇමරිකාවෙනි. ඒ 1754 මැයි 09 වන දිනය. මහා බ්‍රිතාන්‍යයේ බලපෑමට විරුද්ධව පෙන්සිල්වේනියා ගැසට් පත්‍රයේ බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් නම් කාටුන් ශිල්පියා විසින් කැබලි අටකට වෙන් වුනු සර්පයෙක් අඳිමින් එවකට රටේ පැවති අස්ථාවර භාවය නිරූපණය කරන්නට කාටුන් කලාව යොදා ගැනීමත් සමගය.මෙම කාටූනය “join or Die "යනුවෙන් නම් කළේය. පසු කාලීනව ලොව පුරා දේශපාලන කාටුන් කලාව ව්‍යාප්ත වීමත් සමග ශ්‍රී ලංකාවේ පුවත්පත් වල ප්‍රධාන විශේෂාංගයක් ලෙස දේශපාලන කාටූන් නිර්මාණය විය. ලංකාවේ පුවත්පත් වල දේශපාලන කාටුන් ඇඳීම ආරම්භ වන්නේ 1931 දීය. මෙරට පළමු දේශපාලන කාටූනය පළ වූයේ  1931 "ස්වදේශ මිත්‍රයා” පුවත්පතේය. එය ජී.එස් ප්‍රනාන්දු කාටුන් ශිල්පියා විසින් ඩොනමෝර් කොමිසම විවේචනය කරමින් අඳින ලද කාටූනයකි.

දේශපාලන කාටුන් නිර්මාණය කිරීමේදී ඍජුව අදහස් ඉදිරිපත් කිරීමේ හැකියාව පවතී .පවත්නා දේශපාලන රටාව විවේචනය කරමින් දේශපාලකයා දැඩි ලෙස උපහාසයට ලක් කිරීමත් මෙමගින් සිදු වේ. මේ නිසා දේශපාලන කාටුන් ශිල්පීන්ට විවිධ අයහපත් බලපෑම් සිදු වන අතර ඊට බලපාන හේතු සාදක පිළිබඳව ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අධ්‍යයනය කර ඇත. එහිදී ශ්‍රී ලංකාවේ දේශපාලන කාටුන් ශිල්පීන් පස් දෙනෙකු කාටුන් නිර්මාණයේදී මුහුණු පෑ ගැටලු සහ දේශපාලන බලපෑම් යොදාගත්තේය.

මෙම පර්යේෂණයට අනුව දේශපාලන කාටුන් නිර්මාණයේදී පවත්නා දේශපාලන රටාව විවේචනය කිරීම නිසා දේශපාලකයන්ගේ විවිධ තර්ජනයන්ට ලක් වූ අවස්ථා දැකගත හැකිය. එහිදී අත කැපීම, මරණ තර්ජන, රැකියාවෙන් ඉවත් කිරීම ආදී බලපෑම් සිදු වූ අවස්ථා දැකිය හැකිය

මුඛ්‍ය පදඃ දේශපාලන කාටුන්, කාටුන් ශිල්පීන්, බලපෑම

[1] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව madhuaththanayaka@gmail.com

[2] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය,ශ්‍රී ලංකාව
**Dilinigamage07@gmail.com**